1979 -2 - 2

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 6 දරන වාසික ආගන්තුක (බදු නිදහස් කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 ජනවාරි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 25 යි. තැපැල් ගාස්තුව : ශත 25 යි.

1979 අංක 6 දරන වාසික ආගන්තුක (බදු නිදහස් කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 58/78.

ඇතැම් වර්ගවල වාසික වීසා බලපත්‍ර දරන්නන් ඇතැම් බදුවලින් නිදහස් කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 6 දරන වාසික ආගන්තුක (බදු නිදහස් කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1975 පෙබරවාරි මස පළමුවන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

2. (අ) වාසික ආගන්තුකයකුගේ, ශ්‍රී ලංකාවේ දී උද්ගත නො වන යම් ලාභ සහ ආදායම් ; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටකින්, විදේශ ව්‍යවහාර මුදලින් වාසික ආගන්තුකයකු වෙත එවනු ලබන මුදල් තැන්පත් කිරීම සඳහා ඔහු විසින් වාණිජ බැංකු වක විවෘත කරන ලද යම් ගිණුමක ඔහුගේ බැරට තිබෙන මුදල්වලින් ඔහුට උපචිත වන ආදායම

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ අය කළ හැකි ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

*වාසික ආගන්තුකයකුගේ ඇතැම් ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.*

3. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ වැය බද්ද නියම කිරීමට අදාළ විධිවිධාන වාසික ආගන්තුකයකුට අදාළ නොවිය යුතු ය.

*වාසික ආගන්තුකයින් වැය බද්දෙන් නිදහස් වන බව.*

4. (අ) වාසික ආගන්තුකයකුගේ, ශ්‍රී ලංකාවෙන් පිටත ඇති යම් චංචල දේපළ ; සහ

(ආ) 2 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වන ආකාරයේ යම් ගිණුමක වාසික ආගන්තුකයකුගේ බැරට ඇති මුදල්

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ධන බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා, ඔහුගේ ධනය ලෙස ගණන් නොගත යුතු ය.

*ඇතැම් දේපළ ධන බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා වාසික ආගන්තුකයකුගේ ධනය ලෙස ගණන් නොගත යුතු බව.*

5. වාසික ආගන්තුකයකු මිය ගිය විටක දී මුදල් බදු ආඥාපනත යටතේ කිසිම මුදල් බද්දක් ඔහුගේ මුදලය සම්බන්ධයෙන් ගෙවනු නො ලැබිය යුතු ය.

*වාසික ආගන්තුකයකුගේ මුදලය සම්බන්ධයෙන් කිසිම මුදල් බද්දක් නොගෙවිය යුතු බව.*

අර්ථ නිරූපණය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"වාණිජ බැංකුව" යන්නෙහි, මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"පාලකවරයා" යන්නෙහි, ආගාමික හා විගාමික පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය; තව ද

"වාසික ආගන්තුකයා" යන්නෙන්, සංස්කෘතිය හෝ විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨත්වයක් දැක් වූ තැනැත්තකු බවට හෝ තම විශ්‍රාම කාලය තුළ දී ශ්‍රී ලංකාවේ වාසය කිරීමට අදහස් කරන තැනැත්තකු බවට හෝ ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා සෑහීමට පත් වූ විට ඒ අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, පාලක වරයා විසින් ආගාමික හා විගාමික පනත යටතේ වාසික වීසා බලපත්‍රයක් දෙනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ.